# ලංකා සෝල්ට් ලිමිටඩ්

# පුරප්පාඩු

SLS ප්‍රමිති සහතිකය සහ ISO 9001:2015, ISO 22000:2018 ජාත්‍යන්තර තත්ව සහතිකවලින් පිදුම් ලද ලංකාවේ ප්‍රධානතම ලුණු නිෂ්පාදකයා වන ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයගෙන් සේවාවන් ලබාගැනීමට බලාපොරොත්තු වේ.

සුදුසු අයදුම්කරුවන්හට පිළිගත් ආයතනයක / සංවිධානවල අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව පළපුරුද්ද තිබිය යුතු අතර, ඔහු / ඇය ක්‍රියාකාරී හා කාර්යශූර හා බුද්ධිමත් අයෙකු විය යුතුය.

## ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී තනතුර - සුපිරි ශ්‍රේණීය HM-2-1

**රැකියා පැතිකඩ :**

ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් පවරන ලද කළමනාකරණ කාර්යයන් පිළිබඳ සමථ වගකීම දැරිය යුතුය. කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී සමාගමේ සියළුම කටයුතු පිළිබඳ වගකීම / වගවිය යුතු අතර, සභාපති සහ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සෘජුව වාර්තා කළ යුතුය. තවද ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සහ වාර්තා මාණ්ඩලික පත්‍රිකා අනුසාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

**පත්වීමේ ස්වභාවය :**

මෙම පත්වීම ලංකා සෝර්ට් ලිමිටඩ් හි සේවකයන් සඳහා අනුමත සහ එකී තනතුරට අදාළ වරප්‍රසාද සඳහා හිමිකම් සහිත පූර්ණකාලීන පදනමේ පත්වීමකි. ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී භූමිකාව ඉටුකරලීම සඳහා නියමිත කොන්දේසී සහිත ගිවිසුමක් යටතේ කොන්ත්‍රාත් පදනම මත පත්කිරීමේ බලය ලංකා සෝල්ට් ලිමිටඩ් අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර :**

01. IEST, ICA (SL), ACCA, CIMA, CMA මගින් නිකුත් කළ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් හෝ සමාන සුදුසුකම්.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඉංජිනේරු විද්‍යාව, භෞතික විද්‍යාව, ජෛව විද්‍යාව, රසායන විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය, ගිණුම්කරණය, අලෙවිකරණය, තත්ව කළමනාකරණය, වාණිජ, රාජ්‍ය පරිපාලන උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක්

   **සහ**

   ගිණුම්කරණය මූල්‍ය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ඉංජිනේරුමය විද්‍යාව, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBA, MSc) හෝ පිළිගත් වෘත්තිය ආයතනයකින් නිකුත් කළ වෙනත් සමාන වෘත්තීය සුදුසුකමක්. **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසර 12 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 07 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද සමග රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ පිළිගත් වෙළඳ සංස්ථාවක / ආයතනයක සනාථ කළ කාර්ය සාධනය **හෝ**

3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) ශ්‍රී ලංකා සැලසුම් සේවයේ (SLPS) / ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ (SLAcS) 1 වන පංතියේ නිලධාරීන් ඔවුන්ගේ අමාත්‍යාංශ ප්‍රධානීන් මගින් පූර්ණකාලීනව ද්විතික පදනම යටතේ අනුයුක්ත කිරීම සඳහා අයදුම්කළ හැකිය.

**අභ්‍යන්තර :**

ඉහළ කළමනාකරණ ගණයේ (HM 1-3) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා පළපුරුද්ද සමග අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව මට්ටමේ වසර 10 ක් සහිත කළමනාකරණ මට්ටමේ අඩු තරමින් වසර 18 ක පළපුරුද්ද **සහ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඉංජිනේරු විද්‍යාව, භෞතික විද්‍යාව, ජෛව විද්‍යාව, රසායන විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය, ගිණුම්කරණය, අලෙවිකරණය, තත්ත්ව කළමනාකරණය, වාණිජ්‍ය රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලන උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් **සහ**

ගිණුම්කරණය, මූල්‍ය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ඉංජිනේරුමය විද්‍යාව, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBA, MSC) හෝ පශ්චාත් ඩිප්ලෝමාවක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයකින් නිකුත් කළ වෙනත් සමාන සුදුසුකමක් තිබීම. **සහ**

සමාගමේ ඉලක්ක සපුරාගැනීම සඳහා බහුශික්ෂිත කණ්ඩායම් මෙහෙයවීමේ හා මානව හා වෙනත් සම්පත් කළමනාකරණය කිරීමේ සාධිත හැකියාව.

**වයස් සීමාව :**

රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය : HM-2-1: රු. 93,020-12X2,700=125,420/=

## සහකාර සාමාන්‍යාධිකාරී මූල්‍ය තනතුර (HM-1-1)

**රැකියා පැතිකඩ :**

වාර්ෂික අයවැය වාර්තා සකස් කිරීම, මූල්‍ය කටයුතු සැලසුම් කිරීම හා කළමනාකරණය කිරීම, අත ඉතිරි මුදල් පිළිබඳ විශේෂ නැඹුරුව සහිතව වාර්ෂික පදනමක් මත සියළු ගෙවීම් මෙහෙයවීම හා සකස් කිරීම ප්‍රධාන වගකීම හා වපසරිය වේ.

සමාගමේ ගනුදෙනු, මූල්‍ය රෙගුලාසි, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ සමාගමේ රීතී හා රෙගුලාසි හා සමග ගැළපෙන පරිදි සහතික කරලීම පිළිගත් ව්‍යාපාරයන්, ක්‍රමවේදයන් හා ක්‍රියාපටිපාටීන් සමග අනුකූලවීම සහතික කරලීම සඳහා ඉහළ කළමනාකාරිත්වයට සහාය වීම.

**පත්වීමේ ස්වභාවය :**

මෙය ස්ථිර තනතුරක් වන අතර, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ස්ථිර සේවකයන්ට හිමි වරප්‍රසාද සියල්ල මෙම තනතුරට ද හිමි වේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර:**

01. ICA (SL), ACCA, CIMA, CMA පිළිබඳ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් හෝ සමාන සුදුසුකම් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද **හෝ**

02. වාණිජ්‍ය, ගිණුම්කරණය, මූල්‍ය කළමනාකාරිත්වය, රාජ්‍ය / ව්‍යාපාර පරිපාලනය පිළිබද ප්‍රථම උපාධියක් **හෝ**

    ICA (SL), ACCA, CIMA, CMA හි අන්තර් මධ්‍ය සුදුසුකම් හෝ වෙනත් සමාන සුදුසුකම් සමග රජයේ, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර :**

මධ්‍යම කළමනාකරණ ගණයේ (MM1-3) තනතුරට අදාළ ගිණුම්කරණ හා මූල්‍ය පිළිබඳ විෂය පරාසයේ කළමනාකාර තනතුරක අවම වශයෙන් වසර 10 ක සතුටුදායක සේවා පළපුරුද්ද සමග ඉහත සඳහන් කළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.

වැටුප් පරිමාණය : HM-1-1: රු. 80,295-15X2.270=114,345/=

**වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවු. 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

## අභ්‍යන්තර විගණක තනතුර MM 1-1

**රැකියා පැතිකඩ : වගවීමේ ප්‍රධාන වපසරිය**

වාර්ෂික විගණන සැලැස්මට ගැළපෙන පරිදි අභ්‍යන්තර විගණන කාර්යය ඉටුකරලීම සඳහා සහකාර සාමාන්‍යාධිකාරී විගණන මගින් සභාපති වෙත වාර්තා කිරීම.

- කළමනාකරණ විගණනය පිළිබඳව විශේෂ නැඹුරුව සහිතව වාර්ෂික පදනමක් මත අභ්‍යන්තර විගණන සැලැස්ම විධිමත්ව සකස් කිරීම.
- සමාගමේ ගණුදෙනු මූල්‍ය රෙගුලාසි පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ සමාගමේ මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සමග ගැළපෙන බව සහතික කරලීම.
- පිළිගත් ව්‍යවහාරයන් හා ක්‍රියා පටිපාටියන්ගෙන් වන යම් අපගමනයන් නිවැරදි කරලීමට ඉහළ කළමණාකාරිත්වයට සහාය වීම.

**පත්වීමේ ස්වභාවය :**

මෙය ස්ථිර තනතුරක් වන අතර, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ස්ථිර සේවකයන්ට හිමි වරප්‍රසාද සියල්ල මෙම තනතුරට ද හිමි වේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර:**

01. ICA (SL), ACCA, CIMA මගින් නිකුත් කළ වෘත්තීය සුදුසුකම් හෝ සමාන සුදුසුකම් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද හෝ

02. ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, ක්ෂේත්‍රයන්හි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් BSc ප්‍රථම උපාධිය, ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය කළමනාකරණය, වාණිජ්‍ය උපාධියක් හෝ CASL, ACCA, CIMA, CMA හි අන්තර්මධ්‍ය හෝ වෙනත් සමාන සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයේ රජයේ. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් වෙළඳ සංස්ථාවක වසර 3 ක කළමනාකරණ පළපුරුද්ද.

**අභ්‍යන්තර :**

1. තනතුරට අදාළ ගිණුම්කරණ/ විගණන විෂය පථය කණිෂ්ඨ විධායක (JM 1-1) තනතුරේ ගිණුම්කරණය, විගණන විෂය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවාවක් හා ඉහත සඳහන් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් **සහ**
2. සමාගමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපාරික ගණුදෙනු මෙහෙයවීම හා මානව සම්පත් හා අනෙකුත් සම්පත් කළමනාකරණය කිරීමේ සාධන හැකියාව සහිත වීම.

**වයස් සීමාව:**

වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ. වැටුප් පරිමාණය : MM 1-1: රු. 53,175-10x1,375-15x 1,910 = 95,575/=

## රසායනඥ තනතුර - (MM 1-1)

**රැකියා පැතිකඩ :** වගවීමේ ප්‍රධාන වපසරිය පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකරලීම සඳහා ප්‍රධාන රසායනඥට සහ සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන) ට සහාය වීම

1. ලුණු නිෂ්පාදන ක්‍රියාවලිය පාලනය කිරීම සඳහා අදාළ වන ලුණු සහ කාරම් ජලය අනුමත නිර්නායක / ප්‍රමිතියට අනුකූල වන පරිදි විශ්ලේෂණය කිරීම.
2. සියළුම ලේවායන්ට අදාළ සියළුම ලුණු නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලින් අදාළ තත්ව පද්ධතීන් සහ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පවත්වාගෙන යාම.
3. තත්ව අරමුණු ළඟාකර ගැනීම සඳහා රසායනාගාරය සහ තත්ව පාලන කණ්ඩායමට නායකත්වය දීම
4. නිතිපතා නියැදි පරීක්ෂාකර බැලීම හා අවශ්‍ය තත්ව ප්‍රමිතීන් සහිත බවට සහතික වීම.
5. එක් එක් ලේවායන් හි කර්මාන්තශාලා/ යන්ත්‍රාගාර හා නිෂ්පාදන ක්‍රියාදම හා සමග සමීපව කටයුතු කිරීම.

**පත්වීමේ ස්වභාවය :**

මෙය ස්ථිර තනතුරක් වන අතර, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ස්ථිර සේවකයන්ට හිමි වරප්‍රසාද සියල්ල මෙම තනතුරට ද හිමි වේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් රසායන විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, තත්ව කළමනාකරණ හෝ නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකමක් සහ රජයේ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සාධිත සාධන වාර්තා සමග වසර 03 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර :**

අදාළ ක්ෂේත්‍රයේ කණිෂ්ඨ විධායක (JM 1-1) තනතුරක අදාළ විෂය පථයේ අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවාවක් සමග ඉහත සඳහන් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්ලත් සේවකයින් වීම. **සහ**

සමාගමේ ඉලක්ක සපුරා ගැනීමෙහිලා බහු ශික්ෂණ කණ්ඩායම් මෙහෙයවීමේ හා මානව හා අනෙකුත් සම්පත් කළමනාකරණය කිරීමේ සාධිත හැකියාව සහිත වීම.

වැටුප් පරිමාණය : MM 1-1: රු. 53,175-10x1,375-15X1,910 = 95,575/=

**වයස් සීමාව :**

වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

## ප්‍රසම්පාදන කළමනාකරණ තනතුර - (MM 1-1)

**රැකියා පැතිකඩ : වගවීම් ප්‍රධාන වපසරිය.**

ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානී වශයෙන් අංශයේ අරමුණු සපුරා ගැනීම උදෙසා තම රාජකාරි කාර්යක්ෂමව ඉටුකිරීම ප්‍රසම්පාදන අංශයේ සියළු ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සම්බන්ධීකරණය කිරීම සහ කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීමද කළ යුතුය.

**පත්වීමේ ස්වභාවය :** මෙය ස්ථිර තනතුරක් වන අතර, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ස්ථිර සේවකයන්ට හිමි වරප්‍රසාද සියල්ල මෙම තනතුරට ද හිමි වේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය පිළිබඳ උපාධියක් වාණිජ BSc (රාජ්‍ය/ව්‍යාපාර) පරිපාලනය හෝ ඕනෑම ධාරාවකින් සහ සැපයුම් කළමනාකරණය / ප්‍රසම්පාදනය පිළිබඳ පළපුරුද්ද සහ සැපයුම් හා ප්‍රසම්පාදන කළමනාකරණය සඳහා වන වෘත්තීය ආයතනයකින් නිකුත් කළ සමාන සුදුසුකම්. **සහ**

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක සමාන තනතුරක සාධිත ක්‍රියාකාරිත්ව වාර්තා සමග මිලදී ගැනීම් / ප්‍රසම්පාදනය පිළිබඳ විධායක මට්ටමේ අඩු තරමින් වසර 3 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ විධායක (JM1-1) තනතුරක විෂයගත වපසරියක් අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවාවක් සහිත සහ ඉහත සඳහන් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහිත සේවකයින් වීම සහ සමාගමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා බහු ශික්ෂණ කණ්ඩායම් මෙහෙයවීම සහ මානව හා අනෙකුත් සම්පත් කළමනාකරණය කිරීමෙහිලා සාධිත හැකියාවන් සහිත වීම.

වැටුප් පරිමාණය : MM 1-1: රු. 53,175-10x1,375-15 X 1,910 =95,575/=

**වයස් සීමාව :**

වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

## අලෙවි සුපරීක්ෂක (MA - 4)

**උතුරු පළාත සඳහා**

**රැකියා පැතිකඩ :** වගවීමේ ප්‍රධාන වපසරිය

ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සහ විකුණුම් සහ අලෙවි අංශයේ අරමුණු සපුරා ගැනීම සඳහා අලෙවි ප්‍රවර්ධන කළමනාකරුට හා ජාතික විකුණුම් කළමනාකරුට සහාය වීම සහ තමන් වෙත පැවරූ කාර්යයන් ඉහළ නිලධාරීගේ මගපෙන්වීම සහිතව ඉටුකිරීම.

**අවශ්‍ය අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්**

- වාණිජ විෂයයන් සහිතව අ.පො.ස උ/පෙළ සමත්වීම,
- SLIM/SIM වෙතින් අර්ධ වෘත්තීය සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම්
- දමිළ භාෂාව කථා කිරීමේ හා ලිවීමේ දැනුම අත්‍යවශ්‍ය වේ.
- සිංහල හා ඉංග්‍රීසි භාෂා කථනය හා ලිවීම පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.
- අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක කාර්ය / වැඩ පළපුරුද්ද

වැටුප් පරිමාණය : රු. 32,200-10x445-11X660-10x730-5X750 =54,960/- (MA-4)

**වයස් සීමාව:**

වයස අවුරුදු 20 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග අයදුම්පත් සහ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් 2022 ජූලි මස 31 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. අයදුම් කරන තනතුර, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කරන්න.

මෙම තනතුරු සියල්ලම හෝ ඉන් කොටසක් පමණක් හෝ පිරවීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතුවේ. තැපැල් සේවයේ පවතින ගැටළු හේතුවෙන් අයදුම්පතේ හා දත්ත පිටපතේ ස්කෑන් කොපියක් පහත විද්‍යුත් තැපැල් ලිපිනයට යොමුකිරීම අනිවාර්ය වේ. **janakagunawardana@yahoo.com**

**සභාපති,**

**ලංකා සෝල්ට් ලිමිටඩ්,**

**මහලේවාය, හම්බන්තොට.**

**දුරකථනය : 047-2037305**